# දකුණු ආසියාවේ අර්බුද, අන්තරායයන් සහ දුප්පත්කම

## යුක්තිය සහ ගරුත්වය සඳහා වන ජනතා අරගලය




South Asia Alliance for Poverty Eradication
SAAPE

දුප්පත්කම තුරන් කිරීම සඳහා වූ දකුණු ආසියානු සන්ධානය

# 1 හැඳින්වීම



Bonded Labour
Neo-liberal policies
Political
Instability
Wage Cuts
Labour Migration
Climate Crisis
Crony Capitalism
Social Insecurity
Occupational Hazards
Debt Crisis
Social Superstitions
Corruption
Slavery
Bad Governance
SEZ
Violence Against Women
Illiteracy
Unemployment
Child Labour
Caste Discrimination
EEZ
Impunity
Cultural Malpractices
Militarisation
Child Labour
Religious Fundamentalism
Deprivation
Poverty
Deregulation
Droughts
Privatisation
Globalisation
Hire and Fire
Energy Crisis
FTZ
Armed Conflict
Human Rights Violation
Financial Crisis
Dowry System
Famine
Human Trafficking
Injustice
Ecological Damage
Cultural Hegemony
EPZ
Patriarchy

# 1. හැඳින්වීම

දකුණු ආසියාවේ ඈත අතීතයේ සිටම එහි ප්‍රගමණයට දායක වූ සාරවත් ඉතිහාසයක් පවතී. ලොව බොහෝ පැරණි ශිෂ්ටාචාරයන් ගේ මූලය ඇත්තේ දකුණු ආසියාවේය. එම නිසා මෙම ප්‍රදේශය සාරවත් විවිධ සංස්කෘතීන්ගෙන් පෝෂණය වී ඇත. මෙම ප්‍රදේශයේ දරු දූරියෝ දාස භාවයෙන් සහ නොයෙකුත් ආකාරයේ අසාධාරණකම් සහ සූරාකෑම්වලින් මානව වර්ගයා මුදවා ගැනීම ඇතුළත් ඓතිහාසික කාර්ය භාරයක් ඉටු කර කළහ. ස්වභාවික සම්පත් අතින් පොහොසත් දකුණු ආසියාවේ ප්‍රගමණයට සහ සමෘද්ධියට ඉමහත් විභවයක් පවතී.

ඓතිහාසික සන්ර්භයන් සහ භූගෝලීය දායාදයන් දකුණු ආසියාවට බලාපොරොත්තු සහගත ආරම්භයක් සඳහා සුදුසු වුවද අභියෝග රැසකට මුහුණ දීමට සිදුවේ. දකුණු ආසියාවේ ඉමහත් බහුතරයක් වඩාත් හොඳ ජීවන තත්වයක් සඳහා නිරන්තර අරගලක යෙදී සිටිති. ලෝකයේ මුළු ජන සංඛ්‍යාවෙන් හතරෙන් එකක් එනම් බිලියන 1.6 ක් අද ජීවත් වන්නේ දකුණු ආසියාවේය. තවත් කරුණක් වන්නේ ලෝකයේ දුප්පතුන්ගෙන් සියයට 40 ක් පමණ සිටින්නේ දකුණු ආසියාවේ සිටීමය. සුවිශේෂී ලක්ෂණයක් වන්නේ ජන සංඛ්‍යාවේ ප්‍රමාණය මෙන්ම සමාජ ආර්ථික සංවර්ධනයේ මට්ටම හා වේගයේ ඇති සුවිශාල විචල්‍යතාවයන්ය. එය ලොව වෙනත් කලාප වල ජන කණ්ඩායම්වල ස්වභාවයට වෙනස්ය. 2011 වන විට දශ ලක්ෂ 1593 ක්වූ මුළු ජන සංඛ්‍යාවෙන් සියයට 75 ක් සිටින්නේ ඉන්දියාවේය. දෙවැනි තැනට ඇති පාකිස්ථානයේ ප්‍රතිශතය 11. 1 කි. ඉන්පසුව බංග්ලාදේශ් (සියයට 9) ඇෆ්ගනිස්ථානය (සියයට 1.7) නේපාලය (සියයට 1.7) භූතානය (සියයට 0.05 ) මාලදිවයින (සියයට 0.02) යන රටවල් ඇත. ඇමරිකානු ඩොලර් වලින් ගණන් බලන ලද 2011 වසරේ දළ දේශීය නිෂ්පාදිතයේ ඒක පුද්ගල ආදායම අනුව ඩොලර් 6405 ඇති මාලදිවයින ඉදිරියෙන්ම සිටින අතර ඩොලර් 2835 ක් වන ශ්‍රී ලංකාව ඊළඟට සිටී. භූතානයේ ඒක පුද්ගල ආදායම ඇමරිකානු ඩොලර් 2346 කි. ඉන්දියාවේ ඇ. ඩො. 1489 කි. පාකිස්ථානයේ ඇ.ඩො. 1189, බංග්ලාදේශ් ඇ.ඩො. 743, නේපාලය ඇ.ඩො. 619 සහ ඇෆ්ගනිස්ථානයේ ඇ. ඩො. 543 ක් වශයෙනි.[1] රටවල් අටෙන් හතරක් එක්සත් ජාතීන්ගේ වර්ගීකරණය අනුව ඌණ සංවර්ධිත රටවල් ලෙස හැඳින්වෙන අතර ඉන් තුනක් ගොඩබිම් වලින් වටවී ඇත. දකුණු ආසියානු රටවල් අතර ද. දේ. නි. ව්‍යාප්තිය අනුව එහි සමමිතික ස්වභාවයක් නැති බව පෙනේ. නිදසුනක් වශයෙන් 2011 වසරේදී කලාපයේ මුළු ද. දේ. නි. වන ඇ.ඩො.බිලියන 2271 න් සියයට 81.4 ක් අයත් වන්නේ ඉන්දියාවටය. පාකිස්ථානයේ ප්‍රතිශතය 9.3 වන අතර බංග්ලාදේශයේ ප්‍රතිශතය 4.9 කි. ද. දෙ. නි. සාපෙක්ෂකව ද.දෙ.නි. ප්‍රතිශතයේ පවතින පහළ මට්ටම ඇෆ්ගනිස්ථානය හා නේපාලය සම්බන්ධයෙන් හොඳින් කැපී පෙනේ. ඒ රටවල් දෙකටම හිමි වන්නේ සියයට 0.8 ක ප්‍රතිශතයකි.

## 1.1 වර්ධනය, සමානාත්මතාවය සහ මානව සංවර්ධන දර්ශකය (HDI)

දකුණු ආසියානු කලාපයේ රටවල ආර්ථික ක්‍රියාකාරිත්වය බෙහෙවින් වෙනස්වේ. සාපේක්ෂ වශයෙන් දකුණු ආසියාවේ සමහර රටවල, විශේෂයෙන්ම ඉන්දියාව වැනි රටවල ආර්ථික ක්‍රියාකාරිත්වය මත පදනම්ව මෙම කලාපය ලෝකයේ සෙසු රටවල් හා සසඳන විට කැපී පෙනෙන වර්ධනයක් ඇති ප්‍රදේශයක් ලෙස දක්විය හැකිය. (එ. ජා. 2011) යථාර්ථය වන්නේ මෑත වසරවල ශ්‍රී ලංකාව, බංග්ලාදේශය හා මාලදිවයින හැරුණ විට සෙසු රටවල ආර්ථික ක්‍රියාකාරිත්වය අඩු මට්ටමේ හෝ සෘණ තත්වයේ පැවතීමය. මෙම රටවල් තුනේ වර්ධන අනුපාතය 2003 හා 2007 අතර කාලයේදී පැවති සියයට 6.1, 8.0 හා 5.7 සිට 2007 හා 2012 කාලයේ දී අනුපිළිවෙළින් සියයට 6.7, 8.3 හා 7.5 දක්වා වැඩි වීමය.[2] මීට වෙනස්ව මෑත වසරවල 2003 සහ 2007 දී 9.6 ක් වූ ඉන්දියාවේ වර්ධන අනුපාතය 2007 හා 2012 දී 6.9 දක්වා අඩුවීමය. එම කාල පරිච්ඡේද දෙක තුළම පාකිස්ථානයේ වර්ධන ක්‍රියාකාරිතවය සියයට 3.0 ත් 3.5 ත් අතර පහත මට්ටමක පැවතිණ. තවත් වර්ධන ක්‍රියාකාරිත්වයේ අඩු අනුපාතයක් දක් වූ රටක් වන්නේ 2003 - 2007 කාල සීමාවේදී සියයට 4.8 ක් හා 2007 - 2012 3.9 ක් වාර්තා වූ නේපාලයයි. භූතානයේ වර්ධන අනුපාතය 2003 - 2007 දී

1. Source: World Bank online database
2.Ibid
3. Ibid



Struggle for survival: Bangladeshi women workers in the informal sector

සියයට 11.8 සිට 2007- 2012 සියයට 5.6 දක්වා සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටිණ.[3]

ඉහතින් දක්වන ලද සංඛ්‍යාත වලින් දකුණු ආසියාවේ පවතින විෂම වර්ධන අනුපාතය දක්වේ. එම විචල්‍යතාවයන්ගෙන් පැහැදිලි වන්නේ වර්ධනයේ චිරස්ථායි භාවයක් නොමැතිවීමය. ජනතාවගේ ජීවිත කලාපයේ වර්ධනයත් සමග බැඳී ඇති නිසා වර්ධනය මෙන්ම නිමැවුම් ක්‍රියාවලියේ ඔවුන්ගේ සහභාගිත්වය එහි චිරස්ථායී භාවයට අතිශයෙන් වැදගත්ය. එවැනි සහභාගිත්වයක් බැඳී ඇත්තේ ප්‍රතිපත්ති ක්‍රියා මාර්ග සහ ඒ හා පවතින ව්‍යුහාත්මක සහ ආයතනික රටාව මතය. ඒ කරුණු දෙකම නිෂ්පාදන සංවර්ධන බලවේග කෙරේත් සමාජ සම්බන්ධතා තීරණය කිරීමටත් බලපායි. වර්ධනය සංවර්ධනය සමග බැඳී පැවතිය යුතු අතර ඒ තුළ සමානාත්මතාවය සහ සමාජ යුක්තිය ගැබ් විය යුතුය. එම මූලධර්ම දෙකම සංවර්ධනයේ චිරස්ථායී භාවය පවත්වා ගැනීමට අතිශයෙන් වැදගත්ය. මෙම පෙරමුණු දෙකේම දකුණු ආසියාව අවුල් සහගත තත්වයකට මුහුණ දී ඇති බව පෙනේ. අසමානතාවයට ගලපන ලද මානව සංවර්ධන දර්ශකයෙන් සහ ආදායම් සහ අහිමිවීම් අනුව ගණනය කරන දරිද්‍රතාවයෙන් මතු වන්නේ ඉතා නරක චිත්‍රයකි. මෙයින් පෙන්නුම් කරන්නේ සමස්ත තත්වයේ (රටවල් කීපයක සාමාන්‍ය වර්ධන ප්‍රවනතාවයෙන් දක්වෙන පියකරු දර්ශනයෙන් බැහැර වූ) පුළුල් විචලනයේ අනතුරුදායක ස්වභාවයයි.

දකුණු ආසියාවේ මානව සංවර්ධන දර්ශකය වන 0.558 සෙසු කලාප හා සසඳන විට අඩුම අනුපාතයන්ගෙන් එකකි. (UNDP 2013) එය අසමානතාවයට ගැලපූ විට තුනෙන් එකකින්

3. Ibid

පමණ අඩුවී 0.395 ක් වේ. ඉන් දැක්වෙන්නේ දකුණු ආසියාවේ පවතින අසමානතාවයේ ඉහළ මට්ටමයි. බැහැර කිරීමේ ගැටලුව ඉතාම ඉහළ අගයක් ගන්නා 0.568 ක් වන ස්ත්‍රී පුරුෂ අසමානතා දර්ශකයෙන් (GII) වඩාත් කැපී පෙනේ. එය උප සහරා අප්‍රිකාවේ දර්ශකය වන 0.577 ට ඉතාමත් සමීපය.

මානව සංවර්ධන දර්ශකය 0.715 ක් වන ශ්‍රී ලංකාවේ සාපේක්ෂක වශයෙන් ඉහළය. ඊළඟට ඇත්තේ එම දර්ශකය 0.688 ක් වන මාලදිවයිනයි. ඉන්දියාවේ මානව සංවර්ධන දර්ශකය 0.538 ක් වන අතර පාකිස්ථානයේ 0.515 කි. බංග්ලාදේශය 0.515 ක් වන අතර නේපාලයේ 0.463 කි. ඇප්ගනිස්ථානයේ 0.374 කි. එහෙත් අසමානතාවයට ගැලපූ විට එම අනුපාතයන් සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටේ. එම දර්ශකය ශ්‍රී ලංකාවේ 0.607 ක් වන අතර මාලදිවයිනේ 0.392 කි. ඉන්දියවේ 0.430 වන අතර භූතානයේ 0.374 කි. බංග්ලාදේශයේ 0.356 පාකිස්ථානය 0.301, නේපාලය 0.301 කි. නිදසුනක් වශයෙන් මෙම අනුපාත වර්ග දෙකේ අසමානතාවය වැඩියෙන්ම ඇත්තේ බංග්ලාදේශය හා සසඳන විට පාකිස්ථානයේ ය. (වගුව 1.1 හා 1.2 බලන්න.)

2013 මානව සංවර්ධන වාර්තාවෙන් දකුණු ආසියානු බොහෝ රටවල මානව සංවර්ධන දර්ශකය ඉතා පහත මට්ටමක පවතින බව තහවුරු වේ. රටවල් 187 ක් අතරෙන් නෝර්වේ පළමු ස්ථානය හිමි කර ගන්නා අතර නයිගර් රාජ්‍යයට හිමි වන්නේ අවසාන ස්ථානයයි. ශ්‍රී ලංකාව සහ මාලදිවයින සාපේක්ෂ වශයෙන් වඩා හොඳ තත්වයක පවතින නමුත් කලාපයක් වශයෙන් දක-ණු ආසියාවට, අන්තර්ජාතික ප්‍රමිතීන් අනුව යහපත් ජීවිතයකට අත්‍යාවශ වූ ආදායම, සෞඛ්‍යය හා අධ්‍යාපනය සඳහා පිවිසීම අනුව හිමි වන්නේ 'මානුෂික නොවන' තත්වයකි. (1.1 රූපය බලන්න)

එක් එක් දනුණු ආසියානු රටවල ජාතික ආදායම් දරිද්‍රතාවය ගණනය කිරීමේ දී බංග්ලාදේශයේ දරිද්‍රතාවය සියයට 32 ක ආසන්නයේ පවතින අතර ඉන්දියාව (සියයට 29.8) නේපාලය (සියයට 25.2)[4] සහ පාකිස්ථානය සියයට 22.3) වශයෙනි. අඩුම අනුපාතය වාර්තා වන්නේ සියයට 8.3 වන ශ්‍රී ලංකාවෙනි. දිනකට එ. ජ. ඩොලර් 1.25 ක් වශයෙන් දරිද්‍රතා මට්ටම ගණනය කිරීමේ දී දරිද්‍රතාවය සැලකිය යුතු මට්ටමකින් ඉහළ යයි. නිදසුන් වශයෙන් බංග්ලාදේශයේ දරිද්‍රතාවය සියයට 43.3 වන අතර සියයට 32.7 ක් වන ඉන්දියාවත් සියයට 24.8 ක් වන නේපාලය හා සියයට 21 ක් වන පාකිස්ථානය පසුපසින් සිටී.

සම්ප්‍රදායිකව කොන් කරනු ලැබූ සමාජයන් හි අහිමි කරන ලද දරිද්‍රතාවය ගණනය කිරීමේ දී පවතින තත්වය වඩාත් හොඳින් කැපී පෙනේ.[5] අලුත්ම බහුපැතිමාන දරිද්‍රතා ගණනය කිරීම් අනුව දකු-ණු ආසියානු රටවල් බොහොමයක දරිද්‍රතාවය ඉතා ඉහළ මට්ටමක පවතින බව පෙනේ. ප්‍රතිශතයක් අනුව බංග්ලාදේශය, ඉන්දියාව, පාකිස්ථානය සහ නේපාලය යන රටවල දරිද්‍රතාවය පිළිවෙළින් 57.8, 53.7, 49.4 හා 44.2 වශයෙන් දැක්වේ. මාලදිවයින සහ ශ්‍රීලංකාවේ එම අනුපාතය පිළිවෙළින් සියයට 5.2 හා 5.3 වශයෙන් පහළ මට්ටමක පවතී. එම මිනුම් අනුවම සියයට 50 මට්ටමක පවතින තියුණු අහිමි කිරීමක් පාකිස්ථානය, ඉන්දියාව, බංග්ලාදේශය හා නේපාලය යන රටවලින් දැක්වේ. එමෙන්ම දරිද්‍රතා තීව්‍රතාවය සියයට 43.9 ක් වන භූතානයේ ද ඉහළ මට්ටමක පවතී. (UNDP 2013) මෙම සංඛ්‍යා ලේඛන වලින් පැහැදිලි වන්නේ දකුණු ආසියානු රටවලින් බහුතරයක ජනතාවගෙන් වැඩිම කොටසක් අසරණබව, අහිමි කිරීම හා දුකින් පෙළෙන අතර කීප දෙනකු අතර ධනය ඒක රාශී වීමය.[6]

## 1.2 පහත් ආර්ථික වර්ධනයේ සහ මානව සංවර්ධන දර්ශකයේ (HDI) ගැටලු

මෙම කලාපයේ ආර්ථික වර්ධනය පහත් බවත්, මානව සංවර්ධන දර්ශකයේ ක්‍රියාකාරිත්වය දිගටම අසතුටුදායක මට්ටමක පවතින බවත් ඉහත සාකච්ඡාවෙන් පැහැදිලිය. කෙසේ වුවත් මෙම ගැටලු අලුත් ඒවා නොව ඓතිහාසික සහ සමකාලීන ප්‍රශ්න මත රඳා පවතී. ඓතිහාසික වශයෙන් පීතෘ මූලිකත්වය, වැඩවසම් ක්‍රමය, පංතිය, ධුරාවලිය, ආගම, කුලය, වර්ගය, භූගෝලීය පිහිටීම හා වර්ගය පදනම් වූ වෙනස්කොට සැලකිම හෝ බැහැර කිරීම වැනි ව්‍යුහාත්මක සහ පද්ධතී ගැටලු හා බැඳී පවතී.

4. See (CBS 2012)

5. කෙසේ වෙතත් දරිද්‍රතා අනුපාතය ගණනය කිරීමේ මෙම ක්‍රමයේ තවමත් බොහෝ අඩුපාඩු පවතී. අහිමිවීම හා සම්බන්ධ , ඉඩම් වත්කම්, ආහාර සුරක්ෂිත භාවය, නිවාස, ඵලදායි සේවා නියුක්තිය හා අසමානත්වය වැනි නොයෙකුත් දර්ශකවලට හිතු මතයේ බර තැබීම, මිනුම් ඒකකයේ සමජාතීය භාවය ගැන ඇති ප්‍රශ්න, අවධානයට යොමු වන සේවා සැපයීම් ප්‍රමාණය හා විශ්වසනීයත්වය ගැන ඇති කර ගන්නා ප්‍රබල පිළිගැනීම්, හදිසියේ ඇති විය හැකි බලපෑම් වලට අවකාශයත් නොතැබීම වැනි ඒවාය. මෙම සාධක පදනම් කර ගෙන පරිභෝජනය තුළින් දරිද්‍රතාවය ගණනය කිරීමේ හෝ අනෙකුත් අහිමි කිරීම් සමග ආදායම් දරිද්‍රතාවය ගණනය කිරීමේ වඩාත් උසස් අතිරේක මිනුම් දණ්ඩකින් ලබා ගත හැකිය.

6. අද දකුණු ආසියාවේ ධනවත්ම පුද්ගලයන් බිහිව ඇත්තේ ඒකරාශීවීමේ ක්‍රියාවලිය වේගවත්වීමෙන් ජන සංඛ්‍යාවෙන් ඉතාමත් සුළු කණ්ඩායමක් ප්‍රකෝටිපතීන් වීමෙනි. එමනිසා ඇති නැති පරතරය පෙර නොවූ විරූ ආකාරයට පුළුල්වී ඇත.

දකුණු ආසියාවේ ජන සංඛ්‍යාව, ආර්ථික වර්ධන අනුපාතය, ඒක පුද්ගල ආදායම, මානව සංවර්ධන දර්ශකය (HDI), අසමානතාවයට ගලපන ලද HDI ස්ත්‍රී පුරුෂ භාවය පදනම් අසමානතාවය සහ දරිද්‍රතාවය.

| රට | ඇෆ්ගනිස්ථානය | බංග්ලාදේශය | භූතානය | ඉන්දියාව | මාලදිවයින | නේපාලය | පාකිස්ථානය | ශ්‍රී ලංකාව | දකුණු ආසියාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජන සංඛ්‍යාව (දශ ලක්ෂ 2012 මැද) | 33.4 | 152.9 | 0.7 | 1259.7 | 0.3 | 26.6 | 180.4 | 21.2 | 1675.2 |
| දක-ණු ආසියාවේ ජන සංඛ්‍යා ප්‍රතිශතය | 1.99 | 9.13 | 0.04 | 75.20 | 0.02 | 1.59 | 10.77 | 1.27 | 100 |
| ද. දේ. නි. (ඇ.ඩො.) 2011 | 19.2 | 111.9 | 1.7 | 1848.0 | 2.1 | 18.9 | 210.2 | 59.2 | 2271.09 |
| ද. දේ. නි. ප්‍රතිශතය | 0.8 | 4.9 | 0.1 | 81.4 | 0.1 | 0.8 | 9.3 | 2.6 | 100 |
| ඒක පුද්ගල ද. දේ. නි. | 543 | 743 | 2346 | 1489 | 6405 | 916 | 1189 | 2835 | |
| ඒක පුද්ගල PPP (ඇඩො) | 1312 | 1416 | 5113 | 3296 | 5476 | 1115 | 2609 | 4772 | 3268 |
| ද.දේ. නි. වර්ධන අනුපාතය 2003 - 2007 | 8.4 | 6.1 | 11.8 | 9.6 | 5.7 | 4.8 | 3.5 | 8.0 | |
| ද. දේ. නි. වර්ධන අනුපාතය 2008 - 2012 | 5.7 | 6.7 | 5.6 | 9.6 | 5.7 | 3.9 | 3.0 | 8.0 | |
| මානව සංවර්ධන දර්ශකය (HDI) | 0.374 | 0.515 | 0.538 | 0.554 | 0.688 | 0.463 | 0.515 | 0.715 | 0.558 |
| අසමානතාවයට ගැලපු HDI | 0.363 | | 0.392 | 0.495 | 0.301 | 0.346 | 0.579 | 0.579 | 0.393 |
| ස්ත්‍රී පුරුෂ අසමානතාවය | 0.707 | 0.550 | 0.465 | 0.617 | 0.320 | 0.558 | 0.573 | 0.419 | 0.601 |
| MPI දරිද්‍රතා රේඛාවට පහත පුද්ගල ප්‍රතිශතය | | 57.8 | 27.2 | 53.7 | 5.2 | 64.7 | 49.4 | 5.3 | |
| අහිමිවීමේ තීව්‍රතාවය | | 50.4 | 43.9 | 52.7 | 35.6 | 54.0 | 53.4 | 38.7 | |
| PPP අනුව දරිද්‍රතා රේඛාවෙන් පහත ජන සංඛ්‍යාව. දිනකට ඇඩො 1.25 ට අඩු 2000- 2009 | 36.0 | 40.0 | 23.2 | 27.5 | | 30.9 | 22.36 | 15.2 | |
| ජාතික දරිද්‍රතා මට්ටම 2000- 2009 | 36.0 | 40.0 | 23.2 | 27.5 | | 30.9 | 22.3 | 15.2 | |

මූලාශ්‍රය: UNDP (2013) World Bank online database & 2012 World Population Data Sheet

වගු අංක 1.1

2001- 2011 දකුණු ආසියාවේ ළමා මරණ අනුපාතය, අවු.5 ට අඩු මරණ අනුපාතය, උපතේදී ආයු කාලය, වැඩි දියුණු ජල මූලාශ්‍රවලට පිවිසුම සහ වැඩි දියුණු සනීපාරක්ෂාව

| රට | වසර | ඇෆ්ගනිස්ථානය | බංග්ලාදේශය | භූතානය | ඉන්දියාව | මාලදිවයින | නේපාලය | පාකිස්ථානය | ශ්‍රී ලංකාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ළදරු මරණ අනුපාතය | 2001 | 92.7 | 59.2 | 62.6 | 62.4 | 35.7 | 59.3 | 74.3 | 15.8 |
| | 2007 | 80.5 | 44.6 | 49.2 | 52.9 | 16.0 | 46.1 | 65 | 12.4 |
| | 2011 | 72.7 | 36.7 | 42.0 | 47.2 | 9.2 | 36.0 | 59.2 | 10.5 |
| වයස 5 ට අඩු මරණ අනුපාතය | 2001 | 132.8 | 80.0 | 85.2 | 85.0 | 45.3 | 78.9 | 93.0 | 18.4 |
| | 2007 | 113.4 | 57.4 | 64.3 | 70.0 | 19.3 | 58.4 | 80.0 | 14.4 |
| | 2011 | 101.1 | 46.0 | 53.7 | 61.3 | 70.0 | 19.3 | 72.0 | 12.2 |
| උපතේදී ආයු කාලය | 2001 | 45.6 | 65.2 | 62.2 | 62.0 | 71.3 | 62.3 | 63.4 | 71.8 |
| | 2007 | 47.2 | 67.7 | 65.8 | 64.1 | 75.4 | 67.0 | 64.5 | 74.3 |
| | 2011 | | 68.9 | 67.3 | 65.5 | 76.9 | 68.7 | | |
| වැඩි දියුණු කළ ජල මූලාශ්‍ර ඇති ජන අනුපාතයේ ප්‍රතිශතය | 2000 | 21.0 | 79.0 | 91.0 | 81.0 | 91.0 | 83.0 | 88.0 | 80.0 |
| | 2005 | 41.0 | 80.0 | 91.0 | 85.0 | 90.0 | 86.0 | 89.0 | 86.0 |
| | 2008 | 48.0 | 80.0 | 92.0 | 88.0 | 91.0 | 88.0 | 90.0 | 90.0 |
| වැඩි දියුණු සනීපාරක්ෂක ක්‍රම ඇති ජන අනුපාතයේ ප්‍රතිශතය | 2000 | 32.0 | 44.0 | 62.0 | 25.0 | 81.0 | 23.0 | 37.0 | 82.0 |
| | 2007 | 35.0 | 50.0 | 64.0 | 28.0 | 92.0 | 28.0 | 41.0 | 88.0 |
| | 2008 | 37.0 | 53.0 | 65.0 | 31.0 | 98.0 | 31.0 | 45.0 | 91.0 |

මූලාශ්‍රය: UNDP and UNESCAP online database

වගු අංක 1.2

රූපය 1.1

## මානව සංවර්ධන දර්ශකයේ දකුණු ආසියනු රටවලට හිමි ස්ථාන




මෙම රටවල් යටත් විජිත හෝ අත්තනෝමතික පාලනයෙන් මිදී පාර්ලිමේන්තු හෝ ජනාධිපති පාලන ක්‍රම භාවිතා කරන නමුත් තවමත් පැරණි රාජ්‍යය සහ වැසියා ක්‍රමය බලපවත්වන බව පෙනේ. ෆෙඩරල් හෝ ඒකීය පාලන ක්‍රම යටතේ කැපී පෙනෙන වෙනසක් දැකිය නොහැකිය.

පාකිස්ථානය වැනි රටවල් නැවත නැවතත් හමුදාණ්ඩු යටතට පත්විය. අත්තනෝමතික පාලනයට එරෙහිව දශක ගණනාවක් ප්‍රචණ්ඩ අරගල පැවති නේපාලය දැන් දේශපාලන පරිණාමයක් කරා දිග් ගැසුණු ගමනක යෙදී සිටී. 2008 දී තෝරා පත් කළ ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයට වසර හතරකින් පසුව හෝ ව්‍යවස්ථාවක් කෙටුම් පත් කිරීමට අපොහොසත් වූ නිසා 2012 දී විසුරුවා හැරිණ. සමාජ - ආර්ථික පරිණාමයක් සහ දේශපාලන සහ සමාජයීය වශයෙන් ඇතුළත් කර ගැනීමේ පද්ධති කෙරේ අවධානය යොමු වූ මූලික වෙනසක් සොයා යන නමුත් දේශපාලන මට්ටමේ පවතින ගැටුම් හා බැඳුණු දිග් ගැසුණු පරිවර්තනය, ප්‍රගතිශීලී න්‍යාය පත්‍රයක් ආයතන ගත කිරීම පිළිබඳ අවිනිශ්චිත තත්වයක් මතු කරවයි. භූතානය වර්ධනය වෙමින් පවතින ළා බාල ප්‍රජාතන්ත්‍රවාදී රටක් වන අතර මාලදිවයිනේ මහජන ඡන්දයෙන් තේරී පත්වූ ජනාධිපති පලවා හැරීමෙන් ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල කිරීමේ කු-මන්ත්‍රණයක් දිග හැරෙමින් පවතී.

එවැනි වර්ධනයන්ගෙන් පෙනී යන්නේ ජනතාවට දේශපාලන, සිවිල් සහ ආර්ථික අයිතීන් අහිමි කර තිබීම හා දක-ණු ආසියානු රටවල සැබෑ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය තවම ආයතනගත වී නැති බවත්ය. ප්‍රජාතන්ත්‍රවාදය ධනේශ්වර පාලනය සුජාත කිරීමේ උපකරණයක් වශයෙන් කලින් කලට පැවැත්වෙන ඡන්ද විමසීම් වලදී ඡන්ද දායකයන්ට පෙළඹවීම් ලබා දීමට සීමා කිරීම තව දුරටත් පවතී. නීතියේ ආධිපත්‍යය, විවෘත භාවය සහ වගවීම තහවුරු කෙරෙන ශක්තිමත් පද්ධතීන්ගෙන් යුත් ප්‍රජාතන්ත්‍රවාදී ආයතන දැකීමටත් නැත. ජනතාවගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සමාජයේ පහළම මට්ටමට හඳුන්වාදීම සහ ආයතනගත කිරීම මෙතෙක් සිදුව නැත. අධිකරණ පද්ධතියට සමානාත්මතාවය, නීතියේ ආධිපත්‍යය හා මානව අයිතීන්ට අනුකූල වීමට හැකියාවක් නැත. දක-ණු ආසියාවේ බොහෝ තැන්වල සුළු ජාතික ප්‍රජාවගේ අනාරක්ෂිත බව කැපී පෙනේ. බලය අයථා ලෙස යෙදවීමත් සුළු ජාතික අයිතීන් උල්ලංඝණය කිරීමත් සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත. තහනම් කිරීම්, වෙන්කොට සැලකීම්, බැහැර කිරීම් සහ කොන් කිරීම් මත පදනම්ව විවිධාකාරයෙන් ප්‍රකාශයට පත්වන මෙම ගැටුම් නිරන්තරයෙන්ම දැකිය හැකිය. මෙම ගැටුම් පැන නගින්නේ පුළුල්ව පැතිරි දරිද්‍රතාවය හා විවිධ ආකාරයෙන් හා ප්‍රමාණයෙන් යුත් බැහැර කිරීම් හා මූලධර්මවාදයෙන් පෝෂණය වූ සම්ප්‍රදායන්

හා ගැට ගැසුනු යාන්ත්‍රණයන්ගෙනි. ජනතා විරෝධී ආර්ථික ප්‍රතිපත්ති වලින් සනිටුහන් කෙරෙන මෙවැනි ප්‍රවනතා අනාරක්ෂිත භාවය හා අවදානම් සහගත බව ජනතාවගේ ජීවන මාර්ග වලට බලපෑමක් වන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් දරිද්‍රතාවය දිගටම පවතී.

ධනේශ්වර රටවල නිරන්තරයෙන්ම ගැඹුරු වෙමින් වර්ධනය වන අර්බුද ඉහතින් සඳහන් කළ තත්වයට රුකුළක් වන අතර එය වඩාත් අනතුරුදායක කරවයි. 1.2 රූපයේ ඇති වෘත්ත දෙස බැලීමෙන් පමණක් දුප්පත් රටවල ජනතාව හා ආර්ථික කෙරේ බලපෑමක් වන විවිධ අර්බුද ගමන් කරන මාර්ගය ගැන පැහැදිලි දර්ශනයක් ගෙන හැර දක්වයි.

1.2 රූපයෙන් දැක්වෙන ආකාරයට ආහාර, බල ශක්තිය, පාරිසරික, මූල්‍ය සහ ණය යනාදී වශයෙන් තීව්‍ර වන විවිධාකාර අර්බුදයන්ගෙන් යුත් නව ලිබරල් ගෝලීය ධනේශ්වර පද්ධතිය දකුණු ආසියාව ඇතුළත් සංවර්ධනය වන රටවල ආර්ථික මෙන්ම ජනතාවගේ ද අවදානම් සහගත භාවය වඩාත් ගැඹුරු කරවයි. රාජ්‍ය මට්ටමෙන් සමපේක්ෂිත භාවය පදනම් වූ ප්‍රසාරණය හා මවාගත් වස්තුව, ප්‍රාග්ධන ඒකරාශීවීමට හේතු විය හැකි නමුත් ඒ ආර්ථිකයන්ගේ නිෂ්පාදනය හා නිෂ්පාදන පදනම වේගයෙන් බාදනයට ලක්වීමේ අනතුරක් ඇතිවය. මේ අතරතුර සිවිල් සමාජ ව්‍යාපාර දුර්වල කිරීමේ උත්සාහයන් පවතින අතර එය ආදායම් බෙදී යෑමේ බලපෑම් වඩාත් අහිතකරවීමත් සමග ප්‍රමුඛ නිෂ්පාදනය සහ සමාජ සම්බන්ධතා උග්‍ර කරවීමට හේතු විය හැකිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් පහළම මට්ටමේ ජනතාවගේ අවදානම් තත්වය බහුවිධ වූ අර්බුද තත්වයන් මැද ආහාර සුරක්ෂිත භාවය සහ පෝෂණය, සෞඛ්‍යය, අධ්‍යාපනය, නිවාස, ශ්‍රම වෙළඳ පොළ සහ සේවා නියුක්ති ව්‍යුහය, ඉඩම් සහ ස්වභාවික සම්පත් ලබා ගැනීම, භෞතික හා මූල්‍ය සම්පත්, ඒ සියල්ලටම වඩා ජීවන මාර්ග සහ දරිද්‍රතාවය කෙරේ දැඩි පීඩාකාරී බලපෑමක් ගෙනෙනු ඇත.

## 1.3 ධනවාදයේ අර්බුදය සහ කම්කරු පංතියට එරෙහි කුමන්ත්‍රණ

දැනට අපි නිෂ්පාදනයේ පවතින අරාජිකත්වයෙන් ඇති වූ අධි ප්‍රාග්ධන ඒකරාශිවීමක් දකින්නෙමු. එය ප්‍රකාශයට පත් වන්නේ අලෙවි කළ හැකි නිෂ්පාදනයේ අතිරික්තයෙනි. එවැනි ඒක රාශිවීමක් සිදු වන්නේ ජනතාව තුළ පරිභෝජන අවශ්‍යතාවයක් හෝ කැමැත්තක් නැතිවීම නිසා නොව ධනය ඒක රාශිවීම නිසා ජනතාවගෙන් සැහෙන කොටසකට භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාවක් නොමැති නිසාය. කෙසේ වුවත් එය භාණ්ඩ සම්මත ආකාරයේ අධි නිෂ්පාදනයක් වෙනුවට ණය පද්ධතීන්ගේ පුළුල්වීමෙන් ප්‍රාග්ධනය, මුදල් ප්‍රාග්ධනය වශයෙන් ඒකරාශි වීමෙන් වැඩි වැඩියෙන් වියුක්ත, යථාර්තවාදී නොවූ 'මිත්‍යා' ආකාරයන් ගැනීමට ඉඩ ඇත. එමනිසා මෙම පද්ධතිය මෙතෙක් කල් පැවතියේ වැඩිවන ණය බර, ස්වභාවික සම්පත් ක්ෂයවීම කඩිනම් කිරීම, ආදායම් අසමානතා වැඩිවීමෙන් සහ තව දුරටත් පවත්වා ගත නොහැකි සමාජ බැහැර කිරීම් හා අවුල් වියවුල් හරහා කෙරෙන අධික වූ පාරිභෝජ්‍යතාවය තුළිනි. (Cairo+ Cespedes & Grem - Universidad de 2010)

ධනවාදයේ සුවිශේෂී ලක්ෂණය වන්නේ සූරා කෑම තීව්‍ර කිරීම සහ ලාභය තහවුරු කර ගැනීම සඳහා නොයෙකුත් විධි ක්‍රම යෙදීමය. ලාභය මෙම ක්‍රමයේ පැවැත්ම සඳහා වූ පූර්ව අවශ්‍යතාවයකි. කාර්මික ඒකාධිකාරි ධනවාදය අද පනතින මූල්‍ය ධනවාදය බවට පරිවර්තනයවීම කැපී පෙනෙන උදාහරණයකි. නිශ්චිතවම පවසන්නේ නම් වර්තමාන පද්ධති අර්බුදයේ අවම වශයෙන් විවිධ පැතිමාන හතරක් පවතී. ආර්ථික හා මූල්‍ය අර්බුදය, මානව ඌණ සංවර්ධන අර්බුදය, පාරිසරික අර්බුදය හා පාරිසරික ක්ෂයවීම වැඩි කරවන හා ගැටුම් සහ සමාජ අසහනතා වැඩි කරවන සමාජ දේශපාලන හා ආයතනික අර්බුදයයි. මේ ආකාරයට ගෝලීය කරණයෙන් අර්ධ ධනවාදී, ධනවාදී නොවන හෝ පූර්ව ධනවාදී රටවල් ගෝලීය වෙළඳ පොළ බවට අන්තර්ග්‍රහණය කළ නමුත් එය බහු ජනකාවගේ ක්‍රය ශක්තිය එක තැන පල්වෙන අතර ටික දෙනකු වඩාත් ධනවත් වීමෙන් හා ප්‍රාග්ධනය ඒකරාශී වීමෙන් හට ගන්නා අර්බුද ( තාවකාලික වශයෙන් හෝ) සමනය කිරීමට කණගාටුදායක ලෙස අපොහොසත්ව සිටී. බහුවිධ අර්බුද හෝ එහි තීව්‍රතාවය මග හැරීමට හෝ අවම කිරීමට එ.ජ. ඩොලර් ට්‍රිලියන ගණන් වූ කල්පිත ප්‍රාග්ධනය තුරන් කළ යුතු බවට පැහැදිලි සාක්ෂි පවතී. කෙසේ වුවත් පවතින ප්‍රමුඛවන

රූපය 1.2

## අවදානම් බව සහ දරිද්‍රතාවය වර්ධනය කෙරෙන බහුවිධ අර්බුද සම්ප්‍රේෂණය වන යාන්ත්‍රණ



මූල්‍ය කතිපයාධිකාරී පද්ධතිය තුළ දියුණු ධනවාදී රටවල සහ සංවර්ධනය වන රටවල ( මෙම කොටස් ක්‍රියා කරන්නේ ධනවාදී රටවල ධනපතීන්ගේ අන්තේවාසිකයන් ලෙසිනි.) සමීපයෙන් ක්‍රියා කරන පාලක පංතිය හා සුපිරි කොටස් නිසා මෙවැනි දෙයක් කිසිසේත් විය නොහැකිය. ඒ වෙනුවට සිදු වන්නේ ගැඹුරු වෙමින් පවතින අර්බුදයට මුහුණ දීම සඳහා කම්කරු පංතියට හානිකර ප්‍රතිපත්ති, අලුත් හෝ විකල්ප ක්‍රියාමාර්ග ගවේෂණය කිරීම හා ගෝලීය වශයෙන් පැනවීමය.

වෙනත් කරුණු අතර ප්‍රසාරණයෙන් යුත් මූල්‍යකරණය නිසා එක්සත් ජනපදයේ ලිහිල් මූල්‍ය ප්‍රතිපත්තියෙන් 1990 අග භාගයේදී තාක්ෂණ කොටස් වෙළඳ පොළ ප්‍රසාරණයක් ඇති විය. මෙය 2000 සහ 2001 දී බිඳ වැටීමත් සමග අවපාතය ඇති විය. නැවතත් තාක්ෂණ කොටස් වෙළඳ පොළ හා දේපොළ වෙළඳ පොළ සුවිශේෂි ලෙස ඉහළ නැගීමෙන් පසුව, 2003 ජුනි මාසයේ දී මූලික පොලී අනුපාතය (Prime rate ) වසර 45 කට පසුව පැවති පහළම ස්ථානය වූ සියයට එක දක්වා අඩු කිරීමෙන් දිගු කාලීන අවපාතයට මුහුණ දීමට උත්සාහයක් ගැනිණ. මේ සමගම එක්සත් ජනපදයේ නිවාස සහ ඉඩම් අංශයෙන් මතු වූ තවත් ප්‍රසාරණයක් වෙළඳ ශේෂයේ හිඟයකට දායකවීමෙන් අයවැය හිඟයක් පවත්වා ගැනීම කෙරේ දැඩි විශ්වාසයත් පවත්වා ගැනීමට හේතු විය. අවසානයේ දී මෙම ප්‍රසාරණ 2008 දී පිපිරී ගියේ පුළුල් බලපෑමක් සහිත මූල්‍ය අර්බුදයක් ලොව පුරා ඇති කරවමිනි. ගලවා ගැනීම් ( Bail-outs ) හා මූල්‍ය දිරිගැන්වීම් තුළින් එ ජ ඩොලර් ට්‍රිලියන ගණනක් වැය කිරීමෙන් මූල්‍ය වෙළඳ පොළ දියවී යාම තාවකාලිකව වළක්වා ගත හැකි වූ නමුත් මූල්‍ය හිඟය පවත්වා ගැනීම කෙරේ දැඩිව විශ්වාසය රැඳවීම නිසා ධනවාදී රටවල ණය අර්බුදයක් හා අවපාතයේ අනතුරක් මතුවෙමින් පවතී. එය තව දුරටත් කම්කරු පංතියට අහිතකර ප්‍රතිපත්ති බලහත්කාරයෙන් පැනවීම හා තුන්වැනි ලෝකයේ රටවල් දිගටම දුප්පත්ව පවත්වා ගන්නා වෙනත් නව ලිබරල් ප්‍රතිපත්ති හා තදින් බැඳී පවතී.

තව දුරටත් කම්කරු පංති විරෝධී වියදම් අඩු කිරීමේ දැඩි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථා ප්‍රතිපාදනවලට පටහැනිව යුරෝ කලාපයේ සමහර රටවල තාක්ෂණඥයන්ගේ ආණ්ඩු පිහිටුවන ලදී. එක්සත් ජනපදය ඇතුළු බොහෝ ධනපති රටවල අද අනුගමනය කරන ප්‍රතිත්ති තුළින් විශාල සමාගම්, බැංකු සහ මූල්‍ය ආයතනවලට ඉමහත් ලාභ උපයා ගත හැකිය. අනෙක් අතට බහුතරයේ ජීවන මාර්ගවලට තර්ජනයක් වන ඉහළ මට්ටමේ විරැකියාව සහ ආර්ථිකය එක තැන පල්වීම සැලකිල්ලට ගන්නේ නැත. එහිම ප්‍රතිඵලයක් වශයෙන් එක්සත් ජනපදය 2012 ඔක්තෝබර් සිට සෑම මසකම ඩොලර් නෝට්ටු බිලියන ප්‍රමාණයක් මුද්‍රණය කිරීමෙන් ප්‍රමාණාත්මක පහසු කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි. එවැනි ක්‍රියා මාර්ගයක අරමුණ වන්නේ සංවර්ධනය වන රටවල මුදල් වලට සාපේක්ෂකව ඩොලරයේ අගය අවප්‍රමාණය කිරීමයි. ඒ සමගම එක්සත් ජනපදයේ පහත් හෝ පොලී අනුපාතයක් නැති තත්වයක් පවත්වා ගනිමින් විශාල වශයෙන් ප්‍රාග්ධනය ඒ රටවලට ගලා යෑමට සැලැස්වීමෙන් එහි දේපොළ වටිනාකම ඉහළ යෑමට සලස්වයි. අනෙකුත් ධනේශ්වර රටවල් ද ප්‍රමාණාත්මක පහසු කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කිරීමෙන් සංවර්ධනය වන රටවල ආර්ථිකයන් හා ජනතාවගේ ජීවන මාර්ග කෙරේ හානිදායක බලපෑම් ඇති කෙරේ.

දුප්පත් රටවල ඉඩම් අල්ලා ගැනීම, කැනීම් සහ අනෙකුත් ඛනිජ සම්පත් අත් කර ගැනීමට අමතරව බහු ජාතික සමාගම් ( එම රටවල ආණ්ඩු සහාය ඇතිව) වෙළඳ පොළ අල්ලා ගැනීම ද තීව්‍ර කරති. ඍජු හමුදාමය මැදිහත්වීම් සහ වක්‍රව කෙරෙන ආක්‍රමණය වැඩි වශයෙන්ම තෙල් සම්පත්වලින් පොහොසත් රටවල විශාල වශයෙන් වැඩි වී ඇත. සංවර්ධනය වන රටවල දූෂිත ධනවාදය තහවුරු කෙරෙන දුර්වල පාලනය සහ වගවීමේ පද්ධතීන් යොදා ගනිමින් නීති විරෝධී මාර්ගයන් ඔස්සේ ලාභය අත්පත් කර ගන්නා බවද සඳහන් කළ යුතුය. දූෂිත ධනවාදය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පාලන ව්‍යුහ හෙළි කිරීම සහ අපහාසයට ලක් කිරීම සමග සැබෑ ගැටලු වලින් වෙනතකට යොමු කිරීමේ තත්වයක් අන්තර්ජාතික ඒකාධිකාරී ධනපතීන්ගේ අනුබලය ඇතිව නිර්මාණය කර ඇත. එවැනි තත්වයක් යටතේ මිල පාලනය තව තවත් ඉවත් කරමින් කම්කරු පංතියට හානිකර ප්‍රත්පත්ති වඩාත් උග්‍ර කරවයි. එමෙන්ම මේ රටවලට පොදුවේ අන්තර්ජාතික ධනපතීන්ගේත්




Street families in Dhaka, Bangladesh spent their night out in the open - women and girls are most vulnerable to rape and forced prostitution

විශේෂයෙන් බහු ජාතික සමාගම් වලත් ප්‍රාග්ධනය, භාණ්ඩ සහ සේවා වලට නිදහසේ පිවිසීමට ඉඩ සැලසෙන ප්‍රතිපත්ති අනුගමනය කිරීමට බලපෑම් කෙරේ.

## 1.4 වෙනස්වීමට එරෙහිව ජනතා විරෝධය

මෙවැනි අර්බුද තුළ සූරාකෑමේ කතිකාව වෙනස් කිරීමේ හා පීඩිතයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමේ වගකීම රැඳී ඇත්තේ ස්ත්‍රී අයිතිවාසිකම් කණ්ඩායම්, ගොවි අයිතිවාසිකම් කණ්ඩායම්, ධීවර, ආදිවාසි ජන කොටස්, දලිත් ජන කොටස්, සුළුතර ජන කොටස්, වෘත්තීය සමිති හා සමාජ සාධාරණත්වය සහ සමාජ වෙනසක් සඳහා සටන් කරන බලවේග ඇතුළත් ජනතා සහ සමාජ ව්‍යාපාර මතය.

ප්‍රමුඛ වූ ධනේශ්වර ක්‍රමය යටතේ බහුවිධ අර්බුද තුළ ලෝකය පුරාම ජනතාව සූරා කෑම වඩාත් තියුණු වෙත්ම විවිධ මට්ටම්වල ජනතා ව්‍යාපාර වඩාත් ශක්තිමත්ව ඇත. ලෝකයේ නොයෙකුත් තැන්වල ජනතා කැරලි හා නැගී සිටීම් දක්වා වර්ධනය වූ මෙම ව්‍යාපාරය නව ලිබරල් වාදයට එරෙහිව යොමු වී ඇත. අද යුරෝපයේ රාජ්‍ය වියදම් කපා හැරීමට එරෙහි කම්කරු පංතියේ විරෝධය උත්සන්න වෙමින් පවතී. ඊට සමගාමීව වෙනත් කරුණු අතර සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් සහ අවිහරණය, ආහාර සෛවරීත්වය, ඉඩම් අයිතීන් සහ ප්‍රාදේශීය සම්පත් වලට ඇති අයිතිය, ස්ත්‍රී අයිතිවාසිකම්, ආදිවාසි ජනතාව, දලිත්, කම්කරු අයිතින් සහ සමාජ සුරක්ෂිත භාවය, පාරිසරික ආරක්ෂාව සහ ණය කපා හැරීම් කෙරේ අවධානය යොමු වූ විකල්ප සංවර්ධන ආදර්ශ වඩාත් ජයප්‍රියව ඇත.

ගෝලීය සහ කලාපීය මට්ටමේ දී සියලු තැනට එකම ප්‍රතිපත්තිය වෙනුවට ජනතාවාදී ප්‍රතිපත්ති සහ වැඩ සටහන් සඳහා බලපෑම් ගොඩ නැගෙමින් පවතී. එවැනි ව්‍යාපාර වෙනත් කරුණු අතර නව එහෙත් ප්‍රජාතන්ත්‍රීය ගෝලීය මූල්‍ය ව්‍යුහයන් නිර්මාණය කිරීමේ අවශ්‍යතාවය, අසාධාරණ හෝ වෙනස්කොට සැලකීමේ අධිපතිවාදී භාවිතා ඉවත් කිරීම, ව්‍යුහාත්මක ගැලපීමේ වැඩ සටහන් ඉවත් කිරීම, සංවර්ධනය වන රටවල ආර්ථිකයන් විවෘත කිරීම හා නිදහස් කිරීමට කොන්දේසි පැනවීම නැවැත්වීම වෙනුවෙන් බලපෑම් කෙරේ. බහුවිධ අර්බුදවල දැඩි අහිතකර බලපෑම් වලින් සංවර්ධනය වන රටවල් ආරක්ෂා කිරීමට වාස්තවික පියවර අවශ්‍යතාවය පිළිබඳ බලපෑම් ඇති කිරීම හා තීව්‍ර

රූපය 1.3

## ගෝලීය, කලාපීය, ජාතික හා බිම් මට්ටමේ ආර්ථික කතිකාව වෙනස් කිරීමට යොමු වූ බිම් මට්ටමේ ජනතා ව්‍යාපාර

### ගෝලීය/කලාපීය/රටවල් අනුව විශේෂිත ජනතා/ සමාජ ව්‍යාපාර.

- නව ලිබරල් වාදයට එරෙහි ගෝලීය ව්‍යාපාරය
- යුරෝපයේ සහ අනෙකුත් මහාද්වීපවල රාජ්‍ය වියදම් කපා හැරීමට හා කම්කරු පංති විරෝධී ප්‍රතිපත්තිවලට එරෙහි කලාපීය ව්‍යාපාර
- විකල්ප වැඩ පිළිවෙළ පතු-රුවා හැරීම සහ ජනප්‍රිය කිරීමට යොමු වූ බිම් මට්ටමේ ව්‍යාපාරː
  - ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් හා අවිහරණය
  - ආහාර සෛවරීයත්වය, ඉඩම් අයිතිය සහ දේශීය සම්පත් වලට ඇති අයිතිය
  - කාන්තා අයිතීන්, ආදිවාසී ජනතාව, සුළුතර කණ්ඩායම්, දලිත් සහ සමාජයේ අනෙකුත් පීඩිත කොටස්වල අයිතීන්
  - කම්කරු අයිතීන් සහ සමාජ සුරක්ෂිත භාවය සමාජ ආරක්ෂණය
  - පරිසරය ආරක්ෂා කිරීම
  - ණය කපා හැරීම

### ගෝලීය සහ කලාපීය මට්ටම

- සියලු තැනට එකම ප්‍රතිපත්තිය වෙනුවට ගෝලීය ජනතාවාදී ප්‍රතිපත්ති සහ වැඩ සටහන් වලට සහාය දීමට බලකිරීම
- නව එහෙත් ප්‍රජාතන්ත්‍රීය ගෝලීය මූල්‍ය ව්‍යුහයක් නිර්මාණය කිරීමට සහ අසාධාරණ හෝ වෙනස් කොට සලකන ප්‍රමුඛ භාවිතා තුරන් කිරීමට බලපෑම් කිරීම
- ව්‍යුහාත්මක ගැලපීමේ වැඩ සටහන් ඉවත් කිරීමට හා සංවර්ධනය වන රටවල වෙළඳපොළ විවෘත කිරීමට හා ලිහිල් කිරීමට කොන්දේසි පැනවීම නතර කිරීම.

**ගතයුතු පියවර**

- ආහාර, පරිසරය හා ණය අර්බුදය කෙරේ යොමු වූ අවධානය සමග සංවර්ධනය වන රටවල් කෙරේ ඇති බහුවිධ අර්බුද විසඳීමට නිසි අවධානය යොමු කිරීම
- අඩුම සංවර්ධනයක් ඇති රටවලට සහ එහි ජනතාවට විශේෂ හෝ වරණාත්මක සැලකීමක් ලබා දීම
- නීති විරෝධී මූල්‍ය ගලා යෑම නැවතීම සහ මූලික හේතු විසඳීමට

### රටවල් මට්ටමේ ප්‍රතිචාර

- සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට හා නොයෙකුත් ආකාරයේ අසාධාරණකම් වලින් පීඩිත ජනතාව ආරක්ෂා කිරීමට බිම් මට්ටමේ සිවිල් සමාජ සහ අනෙකුත් සමාජ ව්‍යාපාර.
- නව ලිබරල්වාදී ජනතා විරෝධී ප්‍රතිපත්ති සීමා කිරීම සහ ආපසු හැරවීම
- මානව හිමිකම් සුරක්ෂිත කිරීම
- සමාජයේ වයස්ගත, ආබාධිත හා වෙනත් දුර්වල කොටස් ඇතුළත් සමාජ සුරක්ෂිත භාවය පිළිබඳ නීති සහ ව්‍යවස්ථාමය ප්‍රතිපාදන
- රාජ්‍ය සහ බිම් මට්ටමේ විකල්ප සංවර්ධන ආදර්ශ ජනප්‍රිය කිරීම
- ජනතාව බහුවිධ අර්බුදවලින් ආරක්ෂා කිරීමට උපාය මාර්ග සහ වැඩ සටහන් හඳුන්වාදීම.

කිරීම ගෝලීය, කලාපීය, රාජ්‍ය සහ පහළම මට්ටමේ ජනතා ව්‍යාපාරවල වගකීමකි. මෙම ඉලක්ක සපුරා ගැනීමට ජනතා ව්‍යාපාර ඉවහල් වන ආකාරය 1.3 රූ සටහනෙන් දැක්වේ.

සිවිල් සමාජ මුලපිරීම් සහ උතුර සහ දකුණ සමාජ ව්‍යාපාරයන්ට සම්බන්ධ සමාජ කණ්ඩායම්වල සන්ධාන ගොඩ නැගීම හා ජාලයන් ගොඩ නැගීම බහු පාර්ශ්වීය ආයතන හා අනෙකුත් ධනේශ්වර රටවල් ගෙන යන බොහෝ ජනතා විරෝධී පියවර පරාජය කිරීමට පමණක් නොව ජීවන මාර්ග සහ බලගැන්වීම සඳහා විකල්ප විසඳුම් ඉදිරිපත් කිරීමට ද සමත්ව ඇති බව පෙනේ. මේ සම්බන්ධයෙන් පැහැදිලි නිදසුන් වන්නේ සියයට එකට එරෙහිව සියයට අනූනමයේ ගෝලීය ව්‍යාපාරය, අරාබි වසන්තය, යුරෝපීය රටවල ගොඩ නැගෙමින් පවතින දැවැන්ත කම්කරු ව්‍යාපාර, ලතින් ඇමරිකාවේ වාමාංශික ව්‍යාපාරයේ පිබිදීම හා දකුණු ආසියාවේ සහ ලෝකයේ වෙනත් රටවල ජනතා ව්‍යාපාර ශක්තිමත්වීම ය.

# 8

# විකල්ප සංවර්ධන මාදිලියක් පැහැදිලි කිරීම



# 1. විකල්ප සංවර්ධන මාදිලියක් පැහැදිලි කිරීම

මෙම වාර්තාවේ පෙර පරිච්ඡේද වල දී සාකච්ඡා කරන ලද හා 2010 SAAPE වාර්තාවේ සාකච්ඡා කරන ලද විකල්ප සංවර්ධන මාදිලිය වඩාත් ඉදිරියට ගෙන යයි. මින් අදහස් වන්නේ මෙම සාකච්ඡාව වෙනස් වූවක් නොව කලින් වසරේ SAAPE හි දරිද්‍රතා වාර්තාවෙන් ගොඩ නැගූ තර්කය මත දැඩිව රඳා පැවතීමය.

දකුණු ආසියානු අත්දැකීමෙන් පෙනී යන්නේ මූල්‍ය කතිපයාධිකාරයක් බවට පත්ව ඇති ගෝලීය ධනවාදය පෙරටු කර ගත් නව ලිබරල්වාදයට විකල්ප මාදිලියක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයයි. අද මෙම කතිපයාධිකාරය ප්‍රකාශයට පත් වන්නේ පද්ධතියේ තීව්‍රවන බහුවිධ අර්බුද තුළින් කම්කරු පංතිය සූරාකෑම වඩාත් උත්සන්න කරන බහුජාතික සමාගම් ආකාරයෙනි. බහුතරයේ පාලනයේ නාමයෙන් දිග හැරෙන එවැනි ක්‍රමයක් ජනතාවාදී ව්‍යාපාර දුර්වල කරමින් තම බල ප්‍රදේශය ව්‍යාප්ත කිරීමට උත්සාහ ගනී. (SAAPE 2010 ) තමන් පීඩිත ජනතාවගේ පෙරමුණු බල ඇණිය බවට ප්‍රකාශ කර ගත් ප්‍රගතිශීලී බලවේග බොහොමයක් සෘජුව හෝ වක්‍රව කතිපයාධිකරයේ වුවමනාවන්ට සේවය කරන ආර්ථික ක්‍රමයේ නව ලිබරල්වාදයේ ප්‍රබල ආධාරකරුවන්වීම කලකිරීමට පත් කරවන්නකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් නොයෙකුත් විප්ලව හෝ වෙනස්කම් බොහෝ දුරට නිෂ්ඵල වී ඇත. පවතින අර්ථ ක්‍රමය ගෝලීය ආර්ථිකයට අන්තර්ග්‍රහණය වන ක්‍රියාවලියෙන්ම ස්ථාපනය කර තහවුරු කර ඇති නිසා අතරින් පතර කරන ප්‍රතිශෝධන ප්‍රමාණවත් නොවන අතර අසාර්ථකවන බව පැහැදිලිය. දකුණු ආසියාවට විකල්ප සංවර්ධන මාදිලියක අවශ්‍යතාවය ගැන කතා කිරීමේ දී මෙම පාඩම සිත් තබා ගත යුතුය. වෙනත් වචන වලින් නව ලිබරල්වාදය අතික්‍රමණය කිරීමේ දී එක වරම උත්තර්නිර්මිතය හා ආර්ථික පදනමේ වෙනස්කම් කළ යුතුය. අවධානය යොමු විය යුත්තේ නිෂ්පාදන බලවේගවල සැබෑ සංවර්ධනය වැඩි දියුණු කළ හැකි හා ස්ථාවර කළ හැකි විකල්ප ඒකරාශීවීමේ පද්ධතික් හරහා දේශපාලන හා ආර්ථික පද්ධති පදනම් වන වෙනස්කම් කෙරේය. ඒ සඳහා දුප්පතුන්ට හිතකර සහ ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථික ප්‍රතිපත්ති මුලපිරීම් මාලාවක් හරහා නව ලිබරල්වාදයේ භෞතික පදනම ඉවත් කළ යුතුය. එය ආදායම, ධනය, බලය සහ උසස් මට්ටමේ භෞතික සුභ සාධනය වඩාත් සාධාරණව බෙදා හැරෙන සංවර්ධන මාදිලියක් කරා මාරුවීමට ඉවහල් වනු ඇත. (SAAPE 2010) මෙය අව්‍යාජ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා වන මූලික කොන්දේසිය විය යුතුය. එවැනි අදහසක් මත පදනම්ව විකල්ප සංවර්ධන මාදිලියක පුළුල් ලක්ෂණ සහ දකුණු ආසියාවේ බිම් මට්ටමේ සමාජ ව්‍යාපාර, ආයතන හා ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ මට්ටම් වලදී අනුගමනය කළ යුතු වෙනස්කම් වලට දායකවන ක්‍රියාවලියක් පහතින් දක්වේ.

8.1 සම්පත්, අවස්ථා සහ ප්‍රතිලාභ අත්කර ගැනීමෙන් අහිමි වූවන් සහ පීඩිත ජනතාව සූරාකෑම පවත්වාගෙන එන ආර්ථික මාදිලියේ පහතට කාන්දුවන හෝ ඉහළ සිට පහළට ගලා එන පිවිසුම ආපසු හැරවිය යුතුය. ආර්ථික මාදිලියේ ආකාරය සහ ඉලක්කය පැහැදිලි කර ගැනීම සඳහා ජනතාව විසින් සම්පූර්ණ සංවර්ධනයම සකස් කෙරෙන සංවර්ධන කතිකාවක් අත්‍යවශ්‍යය. ඒ සඳහා ජනතාවගේ අධීක්ෂණය හා හිමිකාරිත්වය යටතේ මානව, භෞතික, මූල්‍ය සහ ස්වභාවික සම්පත් උපරිම වශයෙන් යොදා ගැනීමෙන් නිෂ්පාදන බලවේග මුදා හැරෙන ආකාරයට ප්‍රතිපත්ති සහ ආයතන තත්වයන් නිර්මාණය කළ යුතුය. ඒ සඳහා ප්‍රබල ප්‍රාදේශීය පාලන ක්‍රමයක් පැවතීමට අමතරව විවිධ පෙරමුණුවල ශක්තිමත් ජනතා සංවිධාන ප්‍රවර්ධනය කරන තත්වයන්ද නිර්මාණය කළ යුතුය. මෙම පෙරමුණ අහිමි කිරීමේ සහ දරිද්‍රතාවයේ මූලයන් අහෝසි කිරීමට තුඩු දෙන සමාජයීය වෙනසේ සහ පරිණාමයේ පෙරමුණු බලඇණිය වශයෙන් ක්‍රියා කරනු ඇත. මෙසේ පහත සිට ඉහළට එන මාදිලියකින් බිම් මට්ටමේ ජනතා ප්‍රජාතන්ත්‍රීය හිමිකම සහතික කිරීමේ ක්‍රියාවලියේ අන්තර්ගත විවෘත භාවය, වගවීම සහ ප්‍රජාතන්ත්‍රීය පාලනය තහවුරු කළ යුතුය.

8.2 මෙම ප්‍රශ්නයේ මූලය පවතින්නේ පද්ධතියේය. එය ජනතා විරෝධී නෛතික, නියාමන හා අදාල ආයතනික ව්‍යුහයන් හා බැඳී පවතී. මෙය වෙනස් කළ යුතුය. නැතිනම් විකල්ප මාදිලියක බල පැවැත්ම සීමිතය. එමනිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නොයෙකුත් ජනතා කේන්ද්‍රීය ප්‍රතිපාදන හඳුන්වාදීම අත්‍යවශ්‍යයැයි පිළිගැනීම නව මාදිලියක ප්‍රධාන ගුණාංගයකි. වැඩි දුරටත් ඉඩම් අයිතීන්, ආහාර ස්වෛරීත්වය, නිවාස, අධ්‍යාපනය, සෞඛ්‍යය හා වැඩ කිරීමේ අයිතිය පිළිබඳ ගැටලු එවැනි මාදිලියක මුල්ගල් විය යුතුය. නව ව්‍යවස්ථා ප්‍රතිශෝධනයේ දී මෙම ලක්ෂණ ඉල්ලා සිටිය යුතුය. මෙහිදී බල පැවැත්වෙන ක්‍රියාවලිය මූලික වන අතර එය නෛතික, ආයතනික හා ව්‍යුහාත්මක වැඩ පිළිවෙළ හා බැඳී පවතී. බල අධිකාරය සහ දේශීය සහ නව ලිබරල් බලවේග අතර සන්ධානයක් තුළින් ප්‍රතිශෝධන සහ වෙනස් කිරීම් නැවැත්වීමට ප්‍රබල විරෝධතා හෝ කුමන්ත්‍රණ හට ගන්නා ක්ෂේත්‍ර මේවාය. එමනිසා විකල්ප මාදිලියකින් වෙනස්වීම් සඳහා බලපෑම් ඇති කරවන උපාය මාර්ගික මෙවලමක් වශයෙන් විවිධ මට්ටම් වල නිරන්තරයෙන්ම ක්‍රියාත්මක ජනතා ව්‍යාපාර අපේක්ෂා කෙරේ. එය කළ හැක්කේ වේගයෙන් රාජ්‍ය බලපෑම අත්කර ගන්නා සහ රාජ්‍ය ප්‍රතිපත්ති ජනතාවගෙන් ඈතට ගෙන යන සමාගම්වල වුවමනාවන්ට නොව පවතින තත්වය වඩාත් ප්‍රගතිශීලී සහ ප්‍රජාතන්ත්‍රීය පද්ධතියකට පරිණාමය වීමට කෙරෙන දායකත්වයක් තුළිනි.

8.3 ඉහතින් සඳහන් කරන ලද විශ්ව අයිතීන් සහතික කරන අතර ස්ත්‍රීන්ගේ සහ වෙනත් පීඩිත ජන කොටස්වල අයිතීන් තහවුරු කිරීම ද අවශ්‍යය. එය සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමෙන් සිදු කළ යුතු අතර දේශපාලන, රාජ්‍ය, ආර්ථික හා සමාජයීය ආයතනවල ප්‍රමාණාත්මක/සාධාරණ/ සමාන නියෝජනය ස්ථාපිත කස යුතුය. අද අවධානය ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් නාමයෙන් වෙනතකට යොමු කරමින් කුමන ආකාරයෙන් හෝ ධනය ඒකරාශි කර ගැනීම, කෙනෙකුගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ගේ කොටසක් ලෙස සැලකෙන ආර්ථික අයිතිය භුක්ති විඳීමක් ලෙස තර්ක කරති. ඒ ආකාරයට ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට සමාන අයිතිවාසිකම් ලබා දීම ඇතුළු සියලු දෙනාට අවම දේපොළ අයිතිය තහවුරු කිරීමේ දැවෙන ප්‍රශ්නය පසෙකට දැමීමේ දැනුවත් ප්‍රයත්නයක් පවතී. මෙම හෙළිදරව්ව දුප්පතුන් තවත් දුප්පත් කෙරෙන පෞද්ගලික කරණයෙන් පීඩාවට පත් සියලු ජන කොටස් අතරට ගෙන යා යුතුය.

8.4 විකල්ප මාදිලියේ ප්‍රධාන ලක්ෂණ වලින් එකක් වන්නේ එය දැනට ක්‍රියාත්මක වෙමින් පවතින නව ලිබරල්වාදය පදනම් වූ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හෝ රාමු ඉවත දැමීමය. ඒ වෙනුවට එය යෝජනා කරන්නේ වර්ධනය හා ශ්‍රම බලකායේ ඵලදායි සේවා නියුක්තිය හා එකට බැඳෙන ආර්ථිකයේ ඵලදායී හැකියාවන් වැඩි දියුණු කිරීමට යොමු වන සවිස්තරාත්මක ආර්ථික ප්‍රතිපත්තිවල අවශ්‍යතාවයයි. කලින් පැවති ප්‍රධාන ප්‍රවාහයේ ප්‍රතිපත්ති මාලාවේ අවධානය යොමු වූයේ පහතට කාන්දුවීමේ ප්‍රතිපත්තිය තහවුරු කළ වර්ධනයක් කෙරේය. ඉඩම් දේපොළවලට ඇති අයිතිය, සමාජ, භෞතික හා මූල්‍ය සම්පත් වලට සමානව පිවිසීමේ අයිතිය එහි අන්තර්ගත කොටස්ය. එම හේතුව නිසාම විකල්ප මාදිලියක පදනම් වන්නේ ව්‍යුහාත්මක සහ ආයතනික ප්‍රතිශෝධනයි. එය ආර්ථික ස්ථායිකරණය දුප්පතුන්ට හානිකර ප්‍රතිපත්ති පැනවීමේ මූලික උපකරණයක් ලෙස යොදා ගන්නා බදු හා මූල්‍ය ප්‍රතිපත්ති වෙනුවට සංවර්ධනය කෙරේ යොමු වූ සියල්ලන් ඇතුළත් කර ගන්නා ප්‍රතිපත්ති අවධාරණය කරයි. ප්‍රතිපත්ති සම්පාදනයේ දේශීය හිමිකම පවත්වා ගැනීමට ආපසු හැරවීමක් හෝ ප්‍රතිපත්ති මාරුවීමක් අවශ්‍යය. අද ක්‍රමයෙන් වැඩිවන බදු අයකිරීම සහ දුප්පතුන් බදු බරෙන් ඉවත්කිරීම බදු ප්‍රතිපත්තියේ න්‍යාය පත්‍රයෙන් බැහැර කර ඇත. එය නිවැරදි කළ යුතුය. වඩාත් සාධාරණ සමාජ සම්බන්ධතා වැඩි දියුණු කිරීම සඳහා පුළුල්ව පදනම් වූ එහෙත් ක්‍රමානුකූලව වැඩිවන බදු පද්ධති හා බැඳුණු වඩාත් කාර්යක්ෂම සහනදායී වැඩ සටහන් විකල්ප මාදිලියක අන්තර්ගත කොටස් විය යුතුය. අද මෙය සැබෑ අභියෝගයකි. එමනිසා බිම් මට්ටමේ, ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටම්වල ඵලදායි සහ පුළුල් ව්‍යාපාර සඳහා එක්සත් ප්‍රයත්නවල අවශ්‍යතාවයක් පවතී. නව ලිබරල්වාදී ක්‍රමය වෙනුවට විකල්ප මාදිලියක් යොදා ගැනීමට බල කරනු සඳහා තත්වයන් නිර්මාණය කිරීමට ද එය අවශ්‍යය. ඉන් දකුණු ආසියානු ආර්ථිකයන්හි ආත්ම විශ්වාසයද වැඩි දියුණු කරවයි.

8.5 විකල්ප මාදිලියක් සඳහා බලපෑම් කිරීමේ දී වෙනත් කරුණු අතර කාර්යක්ෂම නියාමන සහ ඒකාධිකාරී හෝ කතිපයාධිකාරී නියමයන් තුළින් වෙළඳ පොළ ග්‍රහණයට පත් භාවිතා ඉවත් කිරීම ප්‍රමුඛතාගත කිරීම අත්‍යවශ්‍යය. ‘ප්‍රසාරණ’ දිරිමත් කෙරෙන සහ ජනතාවගේ ජීවන මාර්ග සහ යහ පැවැත්මට හානි කරන සමපේක්ෂණ ව්‍යාපාර ක්‍රියාකාරකම් නතර කළ යුතුය. එහිදී බල කේන්ද්‍රයේ සහ ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ජනතාව සූරාකන බලවේග හෙළිදරවු කිරීමද අවශ්‍යය. සම්පත් වෙන් කිරීමේ දී වඩාත් හොඳින් බෙදා හැරීම සහ කාර්යක්ෂමතාවය වෙනුවෙන් වූ පාරදෘශ්‍ය සහ වගවීමෙන් යුත් පද්ධතියක් මූලික අවශ්‍යතාවයකි. මෙය පුළුල්ව පැතිර ඇති දූෂණය හා අධිකාරය/බලය සාවද්‍ය ලෙස යොදා ගැනීමේ ගජ මිතුරු ධනවාදයෙන් දිරි ගැන්වෙන සදාචාරමය නොවන පුරුදු සීමා කිරීම සඳහා මෙවැන්නක් අවශ්‍යය. ගජ මිතුරු ධනවාදයයට එරෙහි සිවිල් සමාජ ව්‍යාපාරයක කොටසක් වශයෙන් මධ්‍යයේ සිට බිම් මට්ටම දක්වා වූ ප්‍රති තුලන ආයතනික යාන්ත්‍රණයක් විකල්ප මාදිලියේ මූලික අන්තර්ගතයක කොටසක් වශයෙන් සැලකිය යුතුය. මහජන සේවාවල ස්වභාවය අනුව බිම් මට්ටමේ සිට ජනතා සහභාගිත්ව පිවිසුමක් සමානාත්මතාවයට සහ චිරස්ථායී භාවයට වඩාත් හොඳ විකල්පයක් විය හැකිය.

8.6 බිම් මට්ටමේ දී ප්‍රජා සහ සමුපකාර පදනම් නිෂ්පාදනය, සේවා සහ සංවිධාන විකල්ප මාදිලියක වැදගත් අංග ලක්ෂණ වේ. දකුණු ආසියාවේ එහි වැදගත්කම වඩාත් වැඩිවී ඇත. එකිනෙක හා බැඳුනු නිෂ්පාදනය, හුවමාරුව, බෙදා හැරීම හෝ සැපයුම සහ වෙළඳාම් වටිනාකම් නාමයෙන් බහුජාතික සමාගම්වල ජාලයන් බිම් මට්ටම කරා ද පැමිණ ඇත. පොදුවේ සියලු කම්කරුවන් හා විශේෂයෙන් ස්ත්‍රී කම්කරුවන් සූරාකෑම තීව්‍ර කිරීමත් සමග බැඳුනු ප්‍රාදේශීය ඉඩම්, පතල් කැනීම් හා වෙනත් සම්පත් අත්පත් කර ගැනීමේ භාවිතය වැඩිවීමේ අනතුරක් පවතී. වඩාත් යුක්ති සහගත නිෂ්පාදනය සහ සමාජ සම්බන්ධතා ස්ථාවර කිරීමේ කොටසක් වශයෙන් සහ අසමානතාවය වැඩි කරවන ඉහළ සිට පහළට ඇති හානිකර සම්බන්ධතා අහෝසි කිරීමට ද ප්‍රජා මූලික සංවිධාන සහ සමුපකාර ආර්ථිකයේ පදනම් වශයෙන් නිර්මාණය කිරීම හා නගා සිටුවීම අතිශයෙන් වැදගත්ය. දකුණු ආසියාවේ සිවිල් සමාජ සංවිධාන මුල පුරන ලද ව්‍යාපාරවල සාර්ථකත්වය මෙය තහවුරු කරයි.

8.7 ගෝලීය කරණයෙන් බැඳී ඇති අර්බුදවලින් ගහණ ලෝකයක දකුණු ආසියාවේ දුප්පතුන්ගේ, ස්ත්‍රීන්ගේ සහ වැඩ කරන පංතියේ වෙනත් කොටස්වල අවදානම් බව විශාල වශයෙන් වැඩිවී ඇත. ඉලක්ක කණ්ඩායම් සඳහා වූ නොයෙකුත් සහනාධාර සහ වෙනත් වැඩ සටහන් ඇතුළු සීමිත සමාජ ආරක්ෂණ වැඩ සටහන් ඉවත් කිරීමත් සමග ශ්‍රම වෙළඳ පොළ නොවිධිමත් කිරීම නිසා ප්‍රශ්න වඩාත් උග්‍ර කරයි. ඉන් ජීවත්වීම සහ ජීවන මාර්ග පවත්වා ගැනීම වඩාත් අසීරු කෙරිණ. එමනිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති සමහර අයිතිවාසිකම් ප්‍රතිපාදනවලට අමතරව පුළුල් විශ්ව සමාජ ආරක්ෂණ වැඩ පිළිවෙළක් අතිශයෙන් වැදගත්ය. එය ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, තනිව වෙසෙන ස්ත්‍රීන්, ආබාධිතයන් හා සමාජයේ වෙනත් අවදානම්/පීඩිත කොටස් සඳහා විශ්‍රාම ප්‍රතිපාදන ඇතුළත් පොදුවේ නොවිධිමත් අංශයේ ශ්‍රමිකයන් හා විශේෂයෙන් ස්ත්‍රී ශ්‍රමිකයන් ඉලක්ක කර ගත යුතුය.

8.8 හමුදාකරණය වැඩිවීම හා දකුණු ආසියාවේ සමහර රටවල් අතර තවමත් විරසකකම් පැවතීම කලාපයේ අස්ථාවරත්වයට සහ ගැටුම්වලට ප්‍රධාන හේතුවකි. ගැටලු විසඳා ගැනීමට සහ සහයෝගිතාවය ප්‍රවර්ධනය සඳහා අන්‍යෝන්‍ය විශ්වාසය වැඩි දියුණු කිරීම වෙනුවට මැදිහත්වීම් සහ බලහත්කාරය, වෙනත් රටවල ස්වෛරීත්වයට අභියෝගයක් වන අතර එය අන්‍යොන්‍ය සහයෝගිතාවයට නොයෙකුත් ආකාරයේ බාධා පමුණුවයි. ප්‍රජාතන්ත්‍රවාදය පුළුල්වීම සහ හමුදාකරණය එකට යා නොහැකි බව හොඳින් දත් කරුණකි. එමනිසා හමුදාකරණය හෙළා දැකීමත්, දකුණු ආසියානු රටවල් අතර අන්‍යොන්‍ය විශ්වාසය සහ සහයෝගිතාවය සඳහා ව්‍යාපාරයක් ගොඩ නැගීමත් දකුණු ආසියාවේ විකල්ප මාදිලියේ නෛසර්ගික කොටසක් විය යුතුය. කල් පවත්නා සාමය හා සමාජ එකමුතුව ප්‍රවර්ධනය හා දක-ුණු ආසියාවේ සියලු ජන කොටස්වල සමෘද්ධිය එවැනි මාදිලියක ආදර්ශ පාඨය විය යුතුය.

8.9 පොදු ප්‍රශ්න ඇති ජනතාව සමග සන්ධාන ගොඩ නැගීම අසාධාරණ බල සම්බන්ධතා වලට අභියෝග කළ හැකි ඉතාමත් බලවත්

විකල්පයයි. කල් පවත්නා සහ තම ප්‍රජාවේ සාමාජිකයන් ලෙස හා පුද්ගලයන් ලෙස ජනතාවට ගැඹුරින්ම බලපාන සමාජ පරිණාමයක් ඇති කරවන සන්ධාන ගොඩ නැගිමට යොමුවීම හදිසි අවශ්‍යතාවයකි. සමාජ යහ පැවැත්ම පිළිබඳ ගැටලු වලට මෙවලම් පිළිබඳ හෝ තාක්ෂණ විසඳුම් අවශ්‍ය නොවේ. අයිතිවාසිකම් සහ ගරුත්වය පිලිබඳ ගැටලු ගැන කටයුතු කිරීම තුළින් කල් පවත්නා සහ චිරස්ථායී සන්ධාන ගොඩ නැගීම සංවර්ධන අයිතීන්ගෙන් සහ හිමිකම් වලින් බැහැර කරන ලද ලක්ෂ සංඛ්‍යාත ජනතාවට ඒවා සාක්ෂාත් කර ගැනීම සහතික කරනු ඇත. දකුණු ආසියාවේ සමාජ ව්‍යාපාරවල ප්‍රබල සන්ධාන සහ ජනතා වේදිකා ගොඩ නැගීම ජනතාව තුළින් ප්‍රති තුලනය කිරීමේ බලයක් ගොඩ නැගීම සහ සෑම තැනකදීම ජනතාවට බලය ලබාදීම එම අපේක්ෂාව දල්වයි.

රූපය 8.1

# දකුණු ආසියාව සඳහා විකල්ප සංවර්ධන මාදිලියක්

## දකුණු ආසියාව සඳහා විකල්ප සංවර්ධන මාදිලියක්

නව ලිබරල්වාදය සහ මූල්‍ය ධනවාදයට අභියෝග කෙරෙන විකල්ප සංවර්ධන මාදිලියක් සඳහා සියලු මට්ටම්වල ජනතා සන්ධාන. (ගෝලීය, කලාපීය හා රටවල් මට්ටමේ)

දකුණු ආසියාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ එහි වෙනස්කොට නොසැලකීමේ, සියල්ලන් ඇතුළත් කර ගන්නා සහ සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය පද්ධතිය නවීකරණය

මෙම කටයුත්තේදී නියමයන් (ආයතන) වැඩි දියුණු කිරීමෙන් කලින් පැවති සහ සමකාලීන අසමානතා සහ අසාධාරණ වෙනස් කිරීම

### ගෝලීය

- ප්‍රජාතන්ත්‍රීය සහ ජනතාවාදී බලවේග විසින් දැනට පවතින කතිපයාධිකාරී නව ලිබරල්වාදය පෙරටු කර ගත් ගෝලීය ආර්ථික ක්‍රමය ආපසු හැරවීම කෙරේ අවධානය යොමු වූ නව ගෝලීය ව්‍යාපාරයක්
- චිරස්ථායී සංවර්ධනය සහ දුප්පත් රටවල ජනතාවාදී සංවර්ධන වැඩ සටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ වෙනත් ගෝලීය ආයතන ප්‍රජාතන්ත්‍රීය කිරීම සඳහා ව්‍යාපාරයක්
- නීති විරෝධී ණයෑම් සහ සමපේක්ෂන ණයෑම් ඇතුළත් නොයෙකුත් අසාධාරණ මූල්‍ය ණයෑම් නතර කිරීමේ ව්‍යාපාරයක්.
- සංවර්ධනය වන රටවල වෙළඳ පොළ සහ සම්පත් අත්පත් කර ගැනීම සඳහා වන ඉඩම් අත්කර ගැනීම්, පසල් කැනීම්, හමුදා මැදිහත්වීම් සහ වෙනත් ක්‍රම වලට එරෙහිව සටන් කිරීම.
- සංවර්ධන ආධාර සහ සහාය පිළිබඳව දේශීය අයිතිවාසිකම් හා හිමිකම සඳහා ව්‍යාපාරයක්
- බහුවිධ අර්බුදයන්ට ලක්වෙන ගෝලීය ක්‍රමය නිවැරදි කිරීමට මතවාදයක් ගොඩ නැගීම
- අකටයුතු, කොල්ලකෑම්, සූරාකෑම් සහ මැදිහත්වීම් වලට එරෙහිව ගෝලීය සන්ධාන, ජාල ගොඩ නැගීම සහ ව්‍යාපාර

### කලාපීය

- සමාජ ආර්ථික සංවර්ධන මට්ටම සහ ස්ථානීයගතව පවතින විචලනතා සැලකිල්ලට ගෙන සාර්ක් සංවිධානය නවීකරණය
- සමස්ත ආසියානු ජනතාවගේම සුභ සිද්ධිය සහ සමෘද්ධිය තහවුරු කිරීමටත් අන්‍යොන්‍ය සහාය සහ සහයෝගය ප්‍රවර්ධනය සහ ශක්තිමත් කිරීමටත් විවිධ මට්ටම්වල සහ නොයෙකුත් ආකාරයේ දකුණු ආසියානු ජනතා සන්ධාන ශක්තිමත් කිරීම.
- දේශපාලන, ආර්ථික සහ සමාජ අකටයුතු, කොල්ලකෑම සහ ජනතාව සූරාකෑමට එරෙහි සන්ධාන.

### දේශපාලන.

- පැහැදිලි බලය බෙදා හැරීමෙන් වෙනස් කොට සැලකීම් සහ මුල්බැසගත් භාවිතා වළක්වයි.
- රාජ්‍ය ආයතනවල ප්‍රමාණාත්මක නියෝජනය හා ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය
- ජනතාවට තම නියෝජිතයන් ආපසු කැඳවීමේ බලය.
- රාජ්‍ය ආයතනවල සංවරණ සහ තුලන ක්‍රමයක් සඳහා පාරදෘශ්‍ය සහ වගවීමෙන් යුත් පද්ධතියක් සහ ජනතා කේන්ද්‍රීය පාලන ක්‍රමයක්.
- අව්‍යාජ ප්‍රජාතන්ත්‍රීය ක්‍රමයක් ශක්තිමත් කිරීම සහ පීඩිතයන්ගේ අයිතීන් තහවුරු කිරීම.

### ආර්ථිකː නවීකරණය/අහෝසි කිරීම/වෙනස්කම් (ආයතනික සහ නෛතික)

- රජය ප්‍රේරක භූමිකාවක් ඉටු කරන හා ආර්ථිකයේ නිෂ්පාදන පදනම පුළුල් කිරීම හා නිෂ්පාදන බලවේග හැකියා ශක්තිමත් කිරීම කෙරේ යොමුවත් සමඟ සියල්ලන් ඇතුළත් කර ගැනීම, සමානාත්මතාවය, හා චිරස්ථායී භාවය පදනම් වර්ධනය හා සංවර්ධනය අනුව ආයතනික, ව්‍යුහාත්මක සහ ප්‍රතිපත්ති නවීකරණය.
- සාධාරණ, සියල්ලන් ඇතුළත් කර ගන්නා සහ ගුණාත්මක රාජ්‍ය සේවයක් ශක්තිමත් කිරීම.
- ආර්ථික/ මූල්‍ය සේවාවන්ට සාධාරණව පිවිසීම.
- ස්ත්‍රීන් හා පීඩිත ජන කොටස් වලට දේපොළ ලබා ගැනීමේ අයිතිය මෙන්ම බිම් මට්ටමේ ජනතාවට ස්වභාවික සම්පත් ලබා ගැනීමේ අයිතිය.
- සියලු ආකාරයේ ඒකාධිකාර, කාටෙල සහ වෙළඳ පොළ අත්පත් කර ගැනීමේ වෙනත් භාවිතාවන් වෙනුවට කුඩා ව්‍යවසාය හා ව්‍යාපාරික සේවාවන් ඇතුළත් පුද්ගලික අංශයේ අව්‍යාජ සංවර්ධනය ප්‍රවර්ධනය කෙරෙන වෙළඳ පොළ ආයතන ශක්තිමත් කිරීම සහ ප්‍රජාතන්ත්‍රීය කිරීම සහ නොවිධිමත් සූරාකෑමේ භාවිත අහෝසි කිරීම ඇතුළත් නොවිධිමත් ක්‍රියාකාරකම් විධිමත් කිරීම.
- අසමාන සහ අසාධාරණ නිෂ්පාදන සහ සමාජ සම්බන්ධතා වෙනස් කිරීමට බිම් මට්ටමේ සිට සමුපකාර සහ ප්‍රජා සංවිධාන පදනම් නිෂ්පාදනය, බෙදාහැරීම සහ සේවාවන් ප්‍රවර්ධනය කිරීම.

### සමාජ (ආයතනික සහ නෛතික)

- සෞඛ්‍ය, අධ්‍යාපනය, නිවාස, ආහාර ස්වෛරීත්වය, යුක්තිය හා තොරතුරු ලබා ගැනීමට ඇති අයිතිය.
- උල්ලංඝණය කිරීම් හා වෙන්කොට සැලකීම්වලට එරෙහිව ඇති අයිතිය ඇතුළත් ස්ත්‍රී අයිතීන්.
- පංතිය, ස්ත්‍රී පුරුෂ භාවය, වාර්ගිකත්වය, කුලය, සුළුතරය, භූගෝලීය තත්වය, සංස්කෘතිය යනාදී වශයෙන් ප්‍රකාශයට පත්වෙන බැහැර කිරීම් අහෝසි කිරීමට නීති රීති පැනවීම.
- ජනතා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේදී සිවිල් සමාජ සහ වෙනත් සමාජීය අයිතිවාසිකම් කණ්ඩායම්වල ප්‍රේරක භූමිකාව ආයතන ගත කිරීම සහ ජනතා කේන්ද්‍රීය බිම් මට්ටමේ සංවර්ධනය/පරිණාමය වැඩි දියුණු කිරීම.

බිම් මට්ටමේ සිට ජනතා සහභාගිත්ව, විචක්ෂණ හා කාර්යක්ෂම, පාරදෘශ්‍ය හා වගවීමෙන් යුත් පද්ධති.

කම්කරුවන්, අවදානමට ලක් වූ පුද්ගලයන්, වයස්ගත වූවන්. තනිකඩ ස්ත්‍රීන්, ආබාධිතයන් වැනි කණ්ඩායම්වල අයිතීන් ආරක්ෂා කිරීමෙන් සමාජ ආරක්ෂණ පද්ධති වැඩි දියුණු කිරීම.

### ප්‍රතිපත්ති

- ආර්ථිකයේ ඵලදායි පදනම නගා සිටුවීමට චිරස්ථායී ආකාරයට කෘෂිකාර්මික පරිණාමය සහ කාර්මීකකරණය ආර්ථික ප්‍රතිපත්තිය බවට පත් කිරීම හා සමාජ සාධාරණත්වය නගා සිටුවීම සහ විවිධ මට්ටම්වල ජනතාවට පුළුල් ලෙස ප්‍රතිලාභ අත්වෙන දකුණු ආසියානු සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීමට පරිසරය ශක්තිමත් කෙරෙන. අභ්‍යන්තර ඉල්ලීමෙන් දිරි ගැන්වෙන ස්ව විශ්වාසය මත පදනම් ආර්ථිකයක්.
- නව ලිබරල්වාදය පදනම් කර ගත් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ඇතුළත් වොෂින්ටන් එකඟතාවය වෙනුවට සමාජ සහ සේවා නියුක්ති පැති මානයන් වැදගත් අංග ලකෂණ වන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වාදීම.
- බදු සහ මුදල් ප්‍රතිපත්ති නවීකරණය කොට ඒවා වර්ධනය හා සංවර්ධනය කෙරේ යොමු කිරීම.

ස්ථාවර විනිමය අනුපාත ප්‍රතිපත්තියක් හඳුන්වාදීම සහ ප්‍රාග්ධන ගලායෑම සහ යෑම නියාමනය/පාලනය කිරීම

- ආදායම් අසමානතාවය අඩු කිරීමට ක්‍රමයෙන් වැඩිවන බදු ක්‍රමයක් හඳුන්වාදීම සහ බදු බරෙන් ජනතාව ආරක්ෂා කිරීම සහ සම්පත්/ඉතිරුම් ඵලදායි ලෙස යොදා ගැනීම දිරිමත් කිරීම

වෙළඳාම පෙරටු කරගත් ප්‍රතිපත්ති වෙනුවට ආයෝජනය පෙරටු කරගත් ප්‍රතිපත්ති යොදා ගැනීම හා දේශීය සම්පත් පදනම කාර්මික කරණය ප්‍රවර්ධනය.

### සමාජ ප්‍රතිපත්ති/ආයෝජන

- හැකියාව සහ බලගැන්වීම ශක්තිමත් කෙරෙන ප්‍රතිපත්ති.
- අකටයුතු සහ ප්‍රචණ්ඩත්වය, අසාධාරණය සහ වෙනස්කොට සැලකීමට එරෙහි සමාජ ව්‍යාපාර.
- මුහුණ දීමේ උපාය මාර්ග ( සමනය කිරීම හා අනුවර්තනය) නොයෙකුත් ආකාරයේ අවදානම් විසඳීම

**සන්ධාන සහ ජාල ගොඩ නැගීම**

- ප්‍රජාතන්ත්‍රීයකරණය සහ ප්‍රජාතන්ත්‍රවාදය ගැඹුරු කිරීම සහ ලිබරල් ප්‍රජාතනත්‍රවාදයේ අඩුපාඩු හෙළිදරවු කිරීම.
- නිරායුධකරණය හා දේශපාලන ගැටලු වලට හමුදා විසඳුම් නුසුදුසු බව හෙළිදරවු කිරීම.
- ආහාර (පෝෂණය) ස්වෛරීත්වය, ඉඩම් අයිතීන්, ප්‍රාදේශීය සම්පත් පිළිබඳ අයිතිය.
- ස්වභාවික සම්පත් පිළිබඳ ජනතා හිමිකම සහ පාලනය.
- ස්ත්‍රී අයිතීන්, ආදිවාසී ජනතා, ආන්තික කණ්ඩායම්, සුළුතර කණ්ඩායම්, දලිත්, ලිංගික සුළුතර, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්, ළමයින් සහ සමාජයේ වෙනත් පීඩිත කොටස්
- කම්කරු අයිතිවාසිකම් සහ සමාජ ආරක්ෂණය
- පරිසර සංරක්ෂණය සහ දේශගුණික යුක්තිය
- ණය බරින් නිදහස්වීම

ජීවන මාර්ග සහ විරැකියා ප්‍රශ්න විසඳීම සහ ප්‍රාදේශීය සම්පත් සංරක්ෂණයට සහ භාවිතයට බිම් මට්ටමේ සමුපකාර සහ වෙනත් නිෂ්පාදන සංවිධාන ස්ථාපනය සහ ප්‍රවර්ධනය.

South Asia Alliance for Poverty Eradication

SAAPE

දුප්පත්කම තුරන් කිරීම සඳහා වූ දකුණු ආසියානු සන්ධානය